**නැෂනල් ජෙම් ඇන්ඩ් ජුවලරි ඔතෝරිටි - ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි (ප්‍රයිවට්) ලිමිටඩ්හි ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2024/2025**

---

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ - ලංකා ජෙමොලොජිකල් ලැබෝටරි (ප්‍රයිවට්) ලිමිටඩ් හි ("සමාගම") 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මගින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බවට සහතික වියයුතු අතර ඒට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් මාර්ගෝපදේශයෙහි 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු 2014 අප්‍රේල් 01 දින සිට 2025 මාර්තු 31 දින දක්වා වර්ෂ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්

සමාගම විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| වත්කම් | |
| ජංගම වත්කම් | 139,006,695 |
| | ----------------- |
| **මුළු වත්කම්** | **139,006,695** |
| | ========= |

ස්කන්ධය හා වගකීම්

| | |
|---|---|
| ස්කන්ධය හා සංචිත වගකීම් | 124,178,950 |
| ජංගම බැරකම් | 14,827,745 |
| **මුළු වගකීම් හා ස්කන්ධය** | **139,006,695** |
| මුළු ආදායම | - |
| මුළු වියදම | (257,271) |
| **ඌණතාවය** | **(257,271)** |

## 2.3 ගිණුම් හා පොත්පත් පවත්වා ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් 2014 අප්‍රේල් 01 දින සිට 2025 මාර්තු 31 දින දක්වා කාලය සඳහා මුදල්/බැංකු පොත්, ලෙජර ගිණුම්, ගෙවීම් වවුචර්, ජර්නල් හා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ගිණුම්, පොත්පත් හා තහවුරු ලේඛණ නිසි පරිදි පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |

## 2.4 ගෙවිය යුතු ශේෂ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂකවරයකුගේ තායිලන්ත සංචාරයක් සඳහා රු.369,440 ක් ද ජර්මන් සංචාරයක් සඳහා රු.1,032,887 ක් ද 2014 වර්ෂයේදී ගෙවා තිබූ අතර 2024/25 මූල්‍ය වර්ෂය අවසන් වන විටත් එය පියවා නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | විදේශ සංචාර සඳහා ගෙවන ලද මුදල් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සමාගම පිහිටුවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රසායනාගාරයක් පිහිටුවීමේදී කිසියම් පෞද්ගලික පුද්ගලයකු හෝ සංවිධානයක් සමඟ අත්වැල් බැඳ ගැනීම 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ විධිවිධානවලට පටහැනි වන අතර එවැනි රසායනාගාරයක් පිහිටුවීම සඳහා කිසියම් පෞද්ගලික පුද්ගලයකුට හෝ සංවිධානයකට මුදල් මුදා හැරීම නීතිමය ප්‍රතිපාදන දැඩි ලෙස උල්ලංඝනය කිරීමක් බව නීතිපතිතුමා 2005 වර්ෂයේදි පෙන්වා දී තිබුණි. එසේ තිබියදී එම විරෝධය නොසලකා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) සහ ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ සංගමය (SLGJA) අතර ඇති කරගත් එකඟතාවයක් මත මැණික් වල අගය වැඩි කිරීම සඳහා කරනු ලබන පිරියම් කිරීම් සහ මැණික් වල සම්භවය (Origin) තීරණය කිරීමේ පහසුකම් සහිත මැණික් පරීක්ෂණාගාරයක් පිහිටුවිම සහ නිකුත් කරන සහතික සඳහා අන්තර් ජාතික පිලිගැනීමක් ලබා ගැනීම සඳහා ලංකාවේ අංග සම්පූර්ණ මැණික් රසායනාගාරයක් ඇති කිරීමේ අරමුණින් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි නමින් සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස 2008 මැයි මස 29 වන දින සමාගම ස්ථාපිත කර තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සමාගම පිහිටුවීමේ නිත්‍යානුකූල බව පරික්ෂා කර ඒ අනුව ඉදිරි කටයුතු සම්බන්ධයෙන් තීරණය කල යුතුය. |

### 3.2 අරමුදල පිහිටුවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) සහ ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ සංගමය (SLGJA) අතර ඇති කරගත් එකඟතාවයක් මත මැණික් අපනයන වටිනාකම මත අධිකාරිය අයකර ගන්නා සියයට 0.25 ක අපනයන සේවා ගාස්තුවට අමතරව | පිළිතුරු ලබා දී නැත. | ගැසට් පත්‍රයේ පළ නොකර ගාස්තු අයකිරීම නිත්‍යානුකූල නොවන බැවින් සමාගමට බැර කර ඇති මුදල් |

| | | | |
|---|---|---|---|
| | 2001 වර්ෂයේ ජනවාරි සිට තවත් සියයට 0.25 ක සේවා ගාස්තුවක් අධිකාරිය අපනයනකරුවන්ගෙන් අය කර ගෙන “රසායනාගාර සංවර්ධන අරමුදල”ට බැර කර තිබුණි. 2009 ජනවාරි 28 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම අරමුදලේ එකතු වූ රු.92,498,579 ක මුදල 2009 අප්‍රේල් 27 දින ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි පෞද්ගලික සමාගමේ ගිණුමට බැර කර තිබුණි. ඉහත පරිදි අමතර සේවා ගාස්තුවක් අය කිරීම සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. | | සම්බන්ධයෙන් නීති උපදෙස් මත ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ගිණුමට මාරු කරන ලද මුදල හා ඊට අදාළව එකතුවී ඇති පොළිය ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අරමුදලට නැවත මාරු කර එම අරමුදල් උපයෝගී කර ගනිමින් යෝජිත ජාත්‍යන්තරව පිළිගන්නා උසස් තාක්ෂණික රත්න විද්‍යා රසායනාගාරය 1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරී පනතේ 111 වන වගන්තිය යටතේ ස්ථාපිත කිරීමට 2016 අගෝස්තු 24 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී වර්ෂ 08ක් ඉක්මවා තිබුණද එම තීරණය පරිදි කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රත්න විද්‍යා රසායනාගාරයක් නීත්‍යානුකූල ආකාරයෙන් පිහිටවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගම 2008 වර්ෂයේ දී ස්ථාපනය කර 2025 මාර්තු 31 දින වන විට වර්ෂ 16 ක් ඉක්ම වී තිබුණ ද සමාගමේ අරමුණු ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබුණි. 2019 මැයි 16 දිනෙන් පසු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වී නොතිබුණු අතර සමාගම තවදුරටත් ක්‍රියාකාරීව පවත්වාගෙන යාම හෝ එහි කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය නිත්‍යානුකූල පියවර ගෙනද නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | සමාගමේ කටයුතු නිත්‍යානුකූලව අවසන් කිරීම සම්බන්ධයෙන් තීරණය කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා බැංකුව විසින් විගණනයට ඉදිරිපත්කර තිබූ 2025 නොවැම්බර් 19 දිනැති ශේෂ තහවුරු කිරීම අනුව සමාගම සතුව 2025 මාර්තු 31 දිනට | පිළිතුරු ලබා දී නැත. | බැංකු ගිණුම් හා තැන්පතු පිළිබඳ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අංක 76480128 දරන ස්ථාවර තැන්පතුවේ රු.255,344,229 ක ශේෂයක් හා අංක 8160519 දරන ජංගම ගිණුමේ රු.25,840,283 ක ශේෂයක් පැවතුණි. එසේ වුවද ජංගම ගිණුමට අදාල බැංකු ප්‍රකාශන හෝ ස්ථාවර තැන්පතුවට අදාළ අලුත් කිරීමේ නිවේදන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | | |
| (ආ) | ඉහත ජංගම ගිණුමේ පැවති රු.25,840,283 ක ශේෂය කිසිදු ආදායමක් ලබා දෙන මාර්ගයක ආයෝජනය කිරීමකින් තොරව 2015 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | මුදල් ශේෂය කළමනාකරණය කර ගැනීමට හා ඉදිරි කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාගම විසින් ආදායම් බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණු අතර 2014 මාර්තු 31 දිනට ගෙවිය යුතුව තිබූ රු.14,619,695 ක් වූ ආදායම් බද්ද සහ රු.4,784,831 ක් වූ රඳවා ගැනීමේ බදු ශේෂ 2025 මාර්තු 31 දින වන විටත් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. | පිළිතුරු ලබා දී නැත. | ගෙවිය යුතු ආදායම් බදු හා රඳවා ගැනීමේ බදු නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |